සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

420

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	පෙරදිග සංගීතය	පත්‍රය வினாத்தாள் Paper	I	කාලය காலம் Time	පැය 01

නම / විභාග අංකය: .....

I කොටස

විශේෂ උපදෙස්,

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගන්න.

---

(01) මන්ද්‍ර, මධ්‍ය, උච්ච යන සප්තක තුනම ඇතුළත්ව නිර්මාණය වී ඇති ස්වර ප්‍රස්තාරය තෝරන්න.

1. ස̣ ස ධ ප / ග රි ස - / ග - ප ග / ධ ප ග - /
2. ස̣ රි ස නි / ධ ධ ප - / ග රි ස ධ̣ / ස රි ග - /
3. ග රි ග̣ ප / ධ ස̣ ධ ප / ස̣ - ධ ප / ග රි ස - /
4. ග ප ධ ස̣ / රි̣ ග̣ රි̣ ස̣ / ස̣ - ධ ප / ග රි ස - /

(02) බිලාවල්, යමන්, කාෆි යන රාග තුනෙහිම දක්නට ඇති සමාන ලක්ෂණය කුමක් ද?

1. එකම ථාඨයෙන් උපදී,
2. ජාතිය සම්පූර්ණ වේ
3. විවාදී ස්වර යෙදේ
4. ගාන සමය සමාන වේ

(03) ගගරිස, පපගරි, ධධපග, ... යන ස්වර අභ්‍යාසය සඳහා යොදාගත් නිර්දේශිත රාගය නම් කරන්න.

1. බිලාවල් රාගය
2. කාෆි රාගය
3. යමන් රාගය
4. භූපාලි රාගය

(04) ඉහත රාගයේ මධ්‍යම ස්වරය පිළිබඳ ප්‍රකාශ වන නිවැරදි පිළිතුර කුමක් ද?

1. මධ්‍යමය විවාදී ස්වරයකි
2. මධ්‍යමය වාදී ස්වරයකි.
3. මධ්‍යමය වර්ජිත ස්වරයකි
4. මධ්‍යමය වක්‍ර ස්වරයකි

(05) ඉහත ස්වර අභ්‍යාසයේ අවරෝහණයේ පළමු පියවර තෝරන්න

1. පපධස̣
2. ස̣ස̣ධප
3. ස̣ධපප
4. පධස̣ස̣

(06) නි̲ රි̲ ග̲ රි̲ නි̲ ධ̲ නි̲ රි̲ / ග̲ප̲ රි̲- නි̲ රි̲ ස̲- යන ස්වරය තානාලංකාරයට අදාළ වන රාගය නම් කරන්න.

1. යමන් රාගය
2. භූපාලි රාගය
3. කාෆි රාගය
4. බිලාවල් රාගය

(07) "ම ම ප ධ / ම ප නි ස̣ / අ තු ර ඇ / ර ඹෙ නා -"ලෙස ලක්ෂණ ගී පාදය යෙදෙන රාගය පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.

1. සියලු ස්වර ශුද්ධ වන අතර බිලාවල් රාගයට අයත් වේ.
2. "ම" ස්වර වාදී "ස" සංවාදී වන අතර භෛරවී රාගයට අයත් වේ.
3. රි පෙරයම ගැයෙන - යමන් රාගයට අයත් වේ
4. "ප" "ස" වාදී සංවාදී වන අතර කාෆි රාගයට අයත් වේ

CamScanner

Past Papers Wiki

(08) ථායියක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ,

1. අවම වශයෙන් ස්වර 5ක් තිබිය යුතු ය
2. ආරෝහණ අවරෝහණ යන ස්වභාවයන් තිබිය යුතු ය.
3. රස උත්පාදනයක් සිදුවිය යුතු ය.
4. රාගයක් උත්පාදනයට ශක්තියක් ඇති ස්වර සමූහයක් විය යුතු ය.

(09) "සඩ්ජය, ගාන්ධාරය, පංචමය" යන හින්දුස්ථානී ස්වර නාම සඳහා යොදා ගනු ලබන අපරදිග ස්වර නාම පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. Do, Mi, So
2. Do, Fa, Mi
3. Do, Fa, Re
4. Do, Fa, La

(10) "ගී ගයන මේ කුරුලු යාලුවන් හා" සහ "හොඳ දේ හිතමි" යන ස්වර ස්ථාපන ගීත සඳහා යොදා ගත් ස්වර පරාසය කුමක් ද?

1. සරිගම යන ස්වර 4ක පරාසය
2. ස සිට රි ස්වරය තෙක් ස්වර 2ක පරාසය
3. ස සිට ග තෙක් ස්වර 3ක පරාසය
4. ස සිට උච්ච ස තෙක් ස්වර පරාසය

(11) කෝකිල වන්නම ගැයෙන දේශීය තිත් රූප දෙක තෝරන්න.

1. සුළු තනි තිත - මැදුම් තනි තිත
2. මැදුම් තනි තිත - දෙසළු මැදුම් තුන් තිත
3. මහ තනි තිත - මැදුම් තනි තිත
4. දෙසුළු මැදුම් තුන් තිත - මහ තනි තිත

(12) / + දු ර / පෙ නෙ න / තැ නි ත / ලා - - / යන ගී පාදය ගැයෙන ග්‍රහය තෝරන්න.

1. සමග්‍රහය
2. අවග්‍රහය
3. විෂම ග්‍රහය
4. යතියෙනි.

- අංක 13 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

ග ප	ධ - නි	ස් -	ස් රිං ස්
ස් නි	ධ ප -	ම ග	ම රි ස
0	3	x	2

(13) ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන නිර්දේශිත රාගය තෝරන්න.

1. භූපාලි රාගය
2. කාෆි රාගය
3. බිලාවල් රාගය
4. යමන් රාගය

(14) ඉහත ස්වර ප්‍රස්තාරයට අදාළ හින්දුස්ථානී තාලය කුමක් ද?

1. දීප්චන්දි තාලය
2. ජප් තාලය
3. දාදරා තාලය
4. කෙහෙර්වා තාලය

(15) ඉහත නිර්දේශිත රාගය හා ගැළපෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. පූර්වාංගවාදී රාගයකි
2. ඕඩව ජාති රාගයකි
3. ප්‍රකෘති ස්වර සහිත රාගයකි
4. රාත්‍රී කාලයේ ගැයෙන රාගයකි.

CamScanner

- පහත රූප සටහන් ඇසුරින් අංක 16 සිට 18 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



(16) ඉහත A, B, C ලෙස තත් පිහිටීම දක්වා ඇති වාද්‍ය භාණ්ඩ පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1. සිතාරය, ගිටාරය, වීණාව
2. ගිටාරය, වයලීනය, සිතාරය
3. මැන්ඩලීණය, වයලීනය, සිතාරය
4. ගිටාරය, වයලීනය, වීණාව

(17) C අක්ෂරයෙන් දැක්වෙන වාද්‍ය භාණ්ඩය හා ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

1. අලුවෙන් වැයේ
2. ප්‍රධාන තත "ස" ස්වරයට සුසර කරයි
3. ප්‍රධාන තත "නායකී තාර්" නම් වේ
4. පර්දා රහිතයි.

(18) ඉහත A, B, C අක්ෂරවලින් දැක්වෙන වාද්‍ය භාණ්ඩ වාදනය සඳහා උපයෝගී කර ගන්නා වාදන උපකරණ පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. පික්, අළුව, මිස්රාබය
2. මිස්රාබය, පික්, අළුව
3. අළුව, පික්, මිස්රාබය
4. අළුව, මිස්රාබය, පික්

(19) දයානන්ද ගුණවර්ධන ගුරුන්ගේ "ගජමන් පුවත, මධුර ජවනිකා, ජසයා හා ලෙන්චිනා" යන නාට්‍ය සඳහා සංගීතයෙන් දායක වූ සංගීත ශිල්පියා කවු ද?

1. ගුණදාස කපුගේ මහතා
2. ඔස්ටින් මුණසිංහ මහතා
3. රෝහණ බැද්දගේ මහතා
4. සරත් කුලාංග මහතා

- පහත වගුව දක්වා ඇත්තේ දේශීය රංග ශෛලීන් කිහිපයකට අයත් ගී පාදයන් වේ. ඒ ඇසුරින් අංක 20 සිට 23 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A)	(B)	(C)	(D)
වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ	පායාලා අඹරේ චන්ද්‍රයා දිසි සුන්දර රූපේ මාගේ	පෙර සිට පැවත එන සිරිතට පොදිය බැඳගෙන	වාසනා දිනේකි මේක පාමු තුටින්

(20) ඉහත වගුවේ ABCD යන අක්ෂරවලින් දැක්වෙන රංග ශෛලීන් පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. නූර්ති, නාඩගම්, කෝළම්, සොකරි
2. නාඩගම්, නූර්ති, කෝළම්, සොකරි
3. සොකරි, නාඩගම්, කෝළම්, නූර්ති
4. කෝළම්, නාඩගම්, සොකරි, නූර්ති

(21) ඉහත රංග ශෛලීන් සඳහා යොදා ගත් ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ පිළිවෙළින් දක්වා ඇති පිළිතුර කුමක් ද?

1. ගැට බෙරය, මද්දලය, දෙවොල් බෙරය, තබ්ලාව
2. දෙවොල් බෙරය, තබ්ලාව, ගැට බෙරය, දවුල
3. තබ්ලාව, මද්දලය, ගැට බෙරය, දෙවොල් බෙරය
4. දවුල, මද්දලය, ගැට බෙරය, ඩොල්කිය

CamScanner

(22) "සබේ විදානේ" චරිතය ඇතුළත් වන්නේ කුමන ඉංග්‍රීසි අක්ෂරය සඳහා ද?

1. A
2. B
3. C
4. D

(23) "දොහොරාව" නම් විශේෂිත ගායනය සහිත ගී පාදය ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

1. A
2. B
3. C
4. D

(24) "අන්දර යායේ වැව් තාවුල්ලේ, ගමට කලින් හිරු" යන ගීත ගායනා කරන ගායන ශිල්පියා කවු ද?

1. වික්ටර් රත්නායක මහතා
2. කරුණාරත්න දිවුල්ගනේ මහතා
3. එඩ්වඩ් ජයකොඩි මහතා
4. ගුණදාස කපුගේ මහතා

(25) පහතරට සින්දු වන්නම් සඳහා වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

1. දවුල ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ ය වේ.
2. නාමිකව වන්නම් 18කි.
3. බෙර පදය, තානම, කවිය, ඉරට්ටිය ලෙස කොටස් 4කි.
4. කලවානේ ධර්මාලංකාර අතපත්තු මුදලි විසින් සංස්කරණය කර ඇත.

(26) ගැමි ගී වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,

1. සරල භාෂාවක් යොදා ගැනීම
2. නාද රටා සංකීර්ණ වීම
3. දකුණු ඉන්දියානු සංගීත ආභාෂය
4. නිර්මාණකරුවකු නම් කළ හැකි වීම.

(27) ලොව ප්‍රකට ගායන ශිල්පිනියක් වූ "ලතා මංගේෂ්කාර් මහත්මිය" ගායනයෙන් දායක වූ සිංහල චිත්‍රපටය වන්නේ,

1. හුලවාලි
2. රේඛාව
3. සැඩ සුළං
4. ගැටවරයෝ

(28) "සුෂිර" ගණයට අයත් ස්වර පුවරු සහිත වාද්‍ය භාණ්ඩ පමණක් ම යෙදෙන වරණය තෝරන්න.

1. මෙලෝඩිකාව, සින්තසයිසරය, බටනලාව
2. සර්පිනාව, මවුත් ඕගනය, පිකලෝ
3. එකෝඩියනය, සර්පිනාව, මෙලෝඩිකාව
4. ඕගනය, සයිලෆෝන්, පියානෝව

- අංක 29 සිට 32 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පහත සඳහන් රූපසටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



(A)



(B)



(C)



(D)

(29) ඉහත වාද්‍ය භාණ්ඩ අයත් වන වාද්‍ය භාණ්ඩ වර්ගීකරණය තෝරන්න.

1. තත් වාද්‍ය
2. ඝන වාද්‍ය
3. සුෂිර වාද්‍ය
4. අවනද්‍ය වාද්‍ය

(30) අළුවෙන් වැයෙන වාද්‍ය භාණ්ඩ ඇතුළත් ඉංග්‍රීසි අක්ෂර දෙක වන්නේ,

1. A - B
2. A - C
3. A - D
4. B - C

CamScanner

(38) ඉහත (B) සංකේතයෙන් දැක්වෙන ස්කේලය (Scale) කුමක් ද?

1. C Major Scale
2. F Major Scale
3. Bb Major Scale
4. G Major Scale

(39) පරිගණකයක මෘදුකාංග භාවිතයෙන් සංගීත කෘතියක් නිර්මාණය කිරීමේදී අනුගමනය කරනු ලබන මූලික පියවර පිළිවෙළින් දක්වා ඇත්තේ,

1. Compose, Record, Mix, Export
2. Edit, Record, Export, Compose
3. Export, Compose, Mix, Record
4. Record, Edit, Compose, Mix

(40) C Major Scale (ස ශ්‍රැති ස්වරය කර ගත්) ගීතයක් සඳහා යොදා ගත හැකි ප්‍රධාන කෝඩස් (related chord) මොනවා ද?

1. F Major, C Major, G Major
2. C Major, D Major, E Major
3. D Major, G Major, A Major
4. E Major, A Major, B Major

CamScanner

Past Papers Wiki

(31) "B" අක්ෂරයෙන් දැක්වෙන වාද්‍ය භාණ්ඩය වාදනයේ විශිෂ්ටත්වයක් උසුලන ප්‍රකට වාදකයෙකි.

1. පණ්ඩිත් වි.ජී. ජෝග්
2. අසීස් චන්ද්‍ර බෙනර්ජි
3. පිමී හෙන්ඩ්‍රික්ස්
4. පණ්ඩිත් රවි ශංකර්

(32) පෙරදිග - අපරදිග පද්ධති දෙකෙහිම යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ යුගලය තෝරන්න.

1. A-D
2. B-D
3. C-D
4. B-D

- අංක 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේදී පහත ගී පාද ඇසුරු කරගන්න.

A - ලංකා ලංකා පෙම්බර ලංකා පිනවමු ඔබ ලංකා
B - වගු රට නරනිදු දඹදිව පරසිදු
C - අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී

(33) ඉහත A, B, C ගී පාද සඳහා වාදනයට සුදුසු හින්දුස්ථානී තාල පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

1. දාදරා, ලාවනී, දීප්චන්දි
2. කෙහෙර්වා, දීප්චන්දි, දාදරා
3. දීප්චන්දි, ලාවනී, දාදරා
4. ත්‍රි තාල්, ලාවනී, දාදරා

(34) ඉහත A සහ C අක්ෂරවලට වැයෙන තාලයන්ගේ මාත්‍රා ගණන එකතු කළ විට B අක්ෂරයෙන් දැක්වෙන තාලයේ මාත්‍රා ගණනට සමාන වේ. B අක්ෂරයෙන් දැක්වෙන තාලයට අදාළ තාල රටාව තෝරන්න.

1. x - / x - x / - x / x x x /
2. x x - x / x - x x / x x - x / x - x x /
3. x x - / x x x - / x x - / x x x - /
4. x x - / x - x / x - x / x x - /

(35) මහනුවර යුගයේ කවිකාර මඩුවේ නිර්මාණය වූ සේ ගී ඇතුළත් වරණය කුමක් ද?

1. වන්නම්, ප්‍රශස්ති, හටන්
2. සැළලිහිණි සංදේශය, කුවේණි අස්න, හටන්
3. ගුත්තිල කාව්‍ය, ප්‍රශස්ති, සීගිරි ගී
4. යාග ගී, වන්නම්, ගුත්තිල කාව්‍ය

(36) "පොඩි මල් එතනෝ, කරුණා නදියේ, සුනිල ගුවනෙ පායා" ආදී ගුවන් විදුලි සරළ ගී නිර්මාණයෙන් දායක වූ සංගීත ශිල්පියා වන්නේ,

1. සුනිල් ශාන්ත මහතා
2. ආනන්ද සමරකෝන් මහතා
3. මහගම සේකර මහතා
4. ඩෝල්ටන් අල්විස් මහතා

- පහත දැක්වෙන බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ භාවිතා වන සංකේතයකි.



(A)



(B)

(37) ඉහත (A) සංකේතයෙන් ප්‍රකාශ වන අර්ථය කුමක් ද?

1. මාත්‍රා 4ක් නිශ්ශබ්ද බව දැක්වීම
2. මාත්‍රා 3ක් නිශ්ශබ්ද බව දැක්වීම
3. මාත්‍රා 6ක් නිශ්ශබ්ද බව දැක්වීම
4. මාත්‍රා 2ක් නිශ්ශබ්ද බව දැක්වීම

CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	පෙරදිග සංගීතය	පත්‍රය வினாத்தாள் Paper	II	කාලය காலம் Time	පැය 02

II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

i. මේලයට අයත් වුවත්, රාගයෙහි නොයෙදෙන ස්වර හඳුන්වන නම කුමක් ද?

ii. තබ්ලාවෙන් වැයෙන ධ, ධිං, තිං, ත යන අවනද්ධාක්ෂර සියල්ලම යොදා ගැනෙන නිර්දේශිත තාල 2ක් නම් කරන්න.

iii. දීර්ඝ යති සහිත අඩු ලයකින් ගැයෙන, කාන්තාවන් විසින් ගයනු ලබන මෙහෙ ගී විශේෂය කුමක් ද?

iv. සරිස, සරිගරිස, සරිගපගරිස, ..., ... ස්වර විස්තාරය නිර්දේශිත රාගයකට අයත් වේ. එම විස්තාරය උච්ච "ස" තෙක් වර්ධනය කර ලියන්න.

- අංක (v) සිට (vi) තෙක් ප්‍රශ්නවල දී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

v. "සෝබාව දේ මෙපුර සිරි විසිතුරු" ගීතය ..... නාට්‍යයේ ඇතුළත් ගීතයක් වන අතර "රතදර සිරි පරදන නිමල කොමළ" ගීතය ..... නාට්‍යයට අයත් ගීතයකි.

vi. ස්වර සප්තකයක ඇතුළත් සියලු ම ප්‍රකෘති ස්වර සංඛ්‍යාව ..... කි. විකෘති ස්වර සංඛ්‍යාව ..... කි.

(ලකුණු 01 x 08 = 08)

- අංක (vii) සිට (x) තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.
  - අප මුණි සඳ එඊදි බලෙන්
  - තෙදිනි විරාජ රුවිනි විරාජ
  - රතදර සිරියා පරදන රූපෙට වටිනා
  - මල්සරා බැල්ම හෙලා මගේ හිතට කොඳුරනවා
  - චන්ද්‍රයා අඳුරු අහසෙ එයි නැඟී

vii. "ලා සිලෝනියන්ස්" සංගීත කණ්ඩායම විසින් ගායනා කරන ලද ගී පාදය තෝරා ලියන්න.

viii. "චාල්ස් සිල්වා ගුණසිංහ" මහතාගේ නාඩගම් ගී පාදය කුමක් ද?

ix. ජන ගී නාද රටා ආභාෂය කර ගනිමින් නිර්මාණය වූ ගී පාද දෙක තෝරා ලියන්න.

x. "අබුද්දස්ස කෝළම" නාට්‍යයෙහි ඇතුළත් ගී පාදය තෝරා ලියන්න.

(මුළු ලකුණු 12)

CamScanner

(02) පහත දක්වා ඇත්තේ නිර්දේශිත රාග තුනකට අයත් විස්තරයකි.

A - සම්පූර්ණ ජාති - "ග" ස්වර වාදී

B - සම්පූර්ණ ජාති - "ග" සංවාදී

C - ඖඩව ජාති - "ග" ස්වර වාදී

i. ඉහත A, B, C අක්ෂර වලින් හැඳින්වෙන නිර්දේශිත රාග 3 නම් කරන්න. (ලකුණු 03)

ii. A අක්ෂරයෙන් දැක්වෙන රාගයට අදාළව පහත දැක්වෙන රාග විස්තර සම්පූර්ණ කරන්න.

- ආරෝහණ - අවරෝහණ
- ගායන සමය
- ඨාඨය
- සංවාදී ස්වරය

(ලකුණු 04)

iii. B හෝ C අක්ෂර වලින් දැක්වෙන රාග දෙකෙන්, එක් රාගයක් තෝරාගෙන ඊට අයත්

- මධ්‍යලය බ්‍යාල් ගීතයක ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.

නැතහොත්,

- මධ්‍යලය වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර මාත්‍රා 8ක තානාලංකාරයක් ලියන්න.

(ලකුණු 04)

iv. ඔබ විසින් තෝරා නොගත් අනෙක් රාගයට අදාළව ස්වර සංගතියක් ලියන්න. (ලකුණු 01)

(03) පහත සඳහන් වගුව නිර්දේශිත රාග ඇසුරින් ගොඩ නැඟී ඇත.

රාගයේ නම	වාදි	සංවාදි	විශේෂ ලක්ෂණ	ගායන සමය	ස්වර සංගති
1.....	3.....	ස	විකෘති ස්වර සියල්ලම යෙදේ	5.....	සධුපධු මප ගුම
2.....	4.....	ස	විකෘති ස්වර 2ක් පමණක් යෙදේ	6.....	රිගුරිම ගු රි ස

i. ඉහත වගුව සම්පූර්ණ කරන්න (ලකුණු 1/2x6=03)

ii. ඉහත රාග දෙකෙන් එක් රාගයක් තෝරාගෙන ඊට අයත් සර්ගම් ගීතයේ ස්ථායි කොටස තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

iii. ඔබ විසින් තෝරා නොගත් අනෙක් රාගයට අදාළව මාත්‍රා 8කට නොඅඩු තානාලංකාරයක් නිර්මාණය කරන්න. (ලකුණු 02)

iv. පහත සරල ගී පාද නිර්මාණයට දායක කර ගත් නිර්දේශිත රාගයේ නම ඉදිරියෙන් ලියන්න.

A - පාරමිතා බල පූජිත පූජිත .....

B. - සරුංගලේ වරල් සැලේ .....

C - මන්නාරම් පිටි වැල්ලේ .....

(ලකුණු 03)

CamScanner

(04) පහත දැක්වෙනුයේ නිර්දේශිත තාල හතරකට අයත් තොරතුරු සහිත වගුවකි.

	අවනද්ධාක්ෂර	තාලයේ නම	මාත්‍රා ගණන	දේශීය නිත
1	ධා තූ නා	A.....	6	මැදුම් තනි නිත
2	ධි ධි නා	B.....	E.....	G.....
3	තා තිං -	C.....	F.....	H.....
4	තා ධිං ධිං ධා	D.....	16	මහ තනි නිත

i. ඉහත වගුවේ A සිට H දක්වා ඇති හිස්තැන් වලට සුදුසු පිළිතුර අදාළ ඉංග්‍රීසි අකුර ද සමග ලියන්න.

(ලකුණු 1/2 x 8 = 4)

ii. ඉහත වගුව ඇසුරින් පහත ප්‍රශ්නවලට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් යොදන්න.

a) 8 වන මාත්‍රාව මත බලිය යෙදේ .....

b) 4/4 Time Signature සුදුසු තාලයකි .....

c) සරි ග - / ම - -ප / ස්වර ප්‍රස්තාරයට සුදුසු තාලයකි .....

d) "සිරි සාර අති ශාන්ත" ස්වර ස්ථාපන ගී පාදයට වාදනය කරයි .....

(ලකුණු 04)

iii. B සහ C අක්ෂර වලින් දැක්වෙන තාල දෙකෙන් එක් තාලයක් තෝරාගෙන එම තාලයේ යේකාව තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

(05) පහත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ චිත්‍රපට කිහිපයකට අදාළ ගී පාදයන් වේ.
(රේඛාව, සත්සමුදුර, රන්මුතු දූව, සැඩ සුළං, ගැටවරයෝ, හුලවාලි)

චිත්‍රපට ගීතය	චිත්‍රපටයේ නම
1. පිපී පිපී රේණු නටන	
2. සිනිදු සුදු මුතු තලාවේ	
3. සුදු සඳ එළියේ	
4. ආරිච්චි බෝරිච්චි	

i. ඉහත වගුවේ සඳහන් ගී පාද ඇතුළත් චිත්‍රපටය වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 03)

ii. ඉහත චිත්‍රපට අතරින් එක් චිත්‍රපටයක් තෝරාගෙන පහත සඳහන් කරුණු සම්පූර්ණ කරන්න.

a) සංගීත අධ්‍යක්ෂණය -

b) ගී තනු නිර්මාණය -

c) ගායක ගායිකාවන් -

(ලකුණු 03)

iii. මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී අතරින් සුනිල් ශාන්ත මහතා විසින් ගායනා කරන ලද ගීත දෙකක් සහ ආනන්ද සමරකෝන් මහතා විසින් ගායනා කරන ලද ගීත දෙකක් වෙන වෙනම නම් කරන්න. (ලකුණු 04)

iv. ඔබ උගත් මව්ගුණ ගීත දෙකක් නම් කරන්න. (ලකුණු 1)

CamScanner

(06) නාඩගම් සහ නූර්ති රංග ශෛලීන් ඇසුරින් පහත වගුව සකස් වී ඇත.

රංග ශෛලීන්	සංගීත ආභාෂය	දායක වූ සංගීතඥයින්
නාඩගම්	A.....	B.....
නූර්ති	C.....	D.....

i. ඉහත A, B, C, D අක්ෂරවලට ගැළපෙන පිළිතුර ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ලියන්න.
(ලකුණු 04)

- පහත දැක්වෙන්නේ රංග ශෛලීන් දෙකකට අයත් තොරතුරු කිහිපයකි. එම තොරතුරු ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  - කමත රංග භූමිය ලෙස යොදා ගනී.
  - ගැට බෙරය, හොරණෑව, තාලම්පට යොදා ගනී.
  - වෙස් මුහුණු පලඳී.
  - හෙංචප්පු, නොංචි, ආරච්චිල ආදී චරිත ඇතුළත් වේ.
  - සශ්‍රීකත්වයේ සංකේතයකි.
  - සබේ විදානේ චරිතය ඇතුළත් වේ.

ii. ඉහත දැක්වෙන තොරතුරු මඟින් ප්‍රකාශ වන රංග ශෛලීන් දෙක නම් කරන්න.
(ලකුණු 02)

iii. ඉහත සඳහන් තොරතුරු අදාළ රංග ශෛලීන් දෙකට බෙදා වෙන්කර ලියන්න.
(ලකුණු 03)

iv. පහතරට සිංදු වන්නම් වල සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න.
(ලකුණු 03)

(07) පහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. අපරදිග ස්වර ප්‍රස්තාරයට අනුව එය අයත් වන ස්කේලය (scale) නම් කරන්න.
(ලකුණු 01)

ii. ප්‍රස්තාරයට ගැළපෙන time signature එක ලියන්න.
(ලකුණු 01)

iii. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය, පෙරදිග ක්‍රමයට නැවත ලියන්න.
(ලකුණු 04)

iv. ඉහත ප්‍රස්තාරයේ යෙදෙන විකෘති ස්වර මොනවාද?
(ලකුණු 02)

v. මෝසාර්ට් සහ බීතෝවන් යන අපරදිග සංගීතඥයින්ගේ සංගීත නිර්මාණ දෙක බැගින් වෙන් වෙන්ව ලියා දක්වන්න.
(ලකුණු 04)

CamScanner

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2026

ප්‍රශ්න නිවැරැදි කිරීම (සංශෝධනය)

(1) විෂය - පෙරදිග සංගීතය - 10 ශ්‍රේණිය

I පත්‍රය - I කොටස - බහුවරණ ප්‍රශ්න අංක 4 –

මෙහි “ග ස්වර වාදී **ගි** සංවාදී” යන්න “ග ස්වර වාදී **නි** සංවාදී” ලෙස නිවැරැදි විය යුතුයි.

(2) විෂය - පෙරදිග සංගීතය - 11 ශ්‍රේණිය

II පත්‍රය - II කොටස - ප්‍රශ්න අංක 07 හි ඇති ස්වර ප්‍රස්තාරය වෙනුවට මෙහි පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය ආදේශ කරන්න.



Past Papers Wiki

පෙරදිග සංගීතය - 11 ශ්‍රේණිය . 2026 (අවසාන වාර පරීක්ෂණය)
1 කොටස
පිළිතුරු පත්‍රය

1	ii	11	ii	21	i	31	iv
2	ii	12	ii	22	iii	32	iii
3	iv	13	iii	23	iv	33	ii
4	iii	14	ii	24	ii	34	iii
5	i	15	iii	25	iii	35	i
6	i	16	ii	26	i	36	ii
7	iv	17	iii	27	iii	37	iii
8	iv	18	i	28	iii	38	iv
9	i	19	iii	29	i	39	i
10	ii	20	iii	30	ii	40	i

(ලකුණු -1 X40 = 40)

11 කොටස

1.

i. වර්ජිත ස්වර
ii. ත්‍රී තාලය , දීප්චන්දි තාලය
iii. නෙළුම් ගී
iv. සරිස, සරිගරිස, සරිගපගරිස, සරිගපධපගරිස, සරිගපධසධපගරිස (ලකුණු 1X4=04
v. තාරාවෝ ඉගිලෙති / කුස පබා
vi. 7 / 5 (ලකුණු 1X4=04)
vii. චන්ද්‍රයා අඳුරු අහසෙ එයි නැගී
viii. රතදර සිරියා පරදන රූපෙට වටිනා
ix. තෙදිනි විරාජ රුචිනි විරාජ/ මල් සරා බැල්ම හෙලා මගේ හිතට කොදුරනවා
x. අප දුණි සද ඉර්දි බලෙන් (ලකුණු 1X4=04)
(මුළු ලකුනු 12)

2.

A. යමන් රාගය
B. බිලාවල් රාගය
C. භූපාලි රාගය (ලකුණු 03)

ii. යමන් රාගය -

- ආරෝහණ - ස රි ග ම් ප ධ නි ස්
- අවරෝහණ - ස් නි ධ ප ම් ග රි ස
- ගායන සමය- රාත්‍රී ප්‍රථම ප්‍රහරය
- ඨාටය- කල්‍යාණ්
- සංවාදි ස්වරය- නි (නිශාදය) (ලකුණු 04)

iii. මධ්‍යලය ගීතයක ස්ථායි කොටස කෙටස ගීත ස්වර ප්‍රස්තාරය හෝ වාදිතයක ස්ථායි ස්වර ප්‍රස්තාරය මාත්‍රා 8ක තානාලංකාරයක් සමග (ලකුනු 04)

iv. ඉහත තෝරා නොගත් රාගයට අදාලව ස්වර සංගතියක් ලියා දැක්වීම (ලකුණු 01)
බිලාවල් - ම ග ම රි ස , ග ප ධ නි ස් , ග රි ග ප ධ නි ස්
භූපාලි - ග රි ස ධ ස රි ග , ප ග ධ ප ග , ස් ස් ධ ප ග

PAST PAPERS WIKI

Past Papers Wiki

3.

1) හෙරවී රාගය
2) කාෆි රාගය
3) ම
4) ප
5) දිවා ප්‍රථම ප්‍රහරය
6) රාත්‍රී දෙවන ප්‍රහරය (ලකුණු ½ x 6 = 03)

ii. අදාළ රාගයේ සර්ගම් ගීතයේ ස්ථායි කොටස තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීම .(ලකුණු 04)

iii. ඉහත තෝරා නොගත් රාගයට අදාළව මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාරයක් නිර්මානය (ලකුණු 02)

iv. A. හෙරවී රාගය
B. කාෆි රාගය
C. භූපාලි රාගය (ලකුණු 03)

4.

A. දාදරා තාලය
B. ජප් තාලය
C. දීප්චන්දි තාලය
D. ත්‍රී තාලය
E. 10
F. 14
G. සුළු මැදුම් දෙතිත
H. මැදුම් මහ දෙතිත (ලකුණු ½ x 8= 04)

ii.

a) C
b) D
c) A
d) B (ලකුණු 04)

iii. ජප් තාලය හෝ දීප්චන්දි තාලය තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීම (ලකුණු 04)

මාත්‍රා	1 2	3 4 5	6 7	8 9 10
යේකාව	ධි න	ධි ධි න	නි න	ධි ධි න
තාල සංඥා	X	2	0	3

මාත්‍රා	1 2 3	4 5 6 7	8 9 10	11 12 13 14
යේකාව	ධා ධිං -	ධා ධා ධිං -	තා තිං -	ධා ධා ධිං -
තාල සංඥා	X	2	0	3

5.

පිපි පිපී රේණු	රන් මුතු දූව
සිනිදු සුදු මුතු	සත්සමුදුර
සුදු සද එලියේ	රේඛාව
ආරිච්චි බෝරිච්චි	ගැටවරයෝ

(ලකුණු 04)

PAST PAPERS WIKI

ii.

චිත්‍රපටය	සංගීත අධ්‍යක්ෂණය	ගී තනු නිර්මාණය	ගායක ගායිකාවන්
රන් මුතු දුව	ඩබ්. ඩී. අමරදේව	ඩබ්. ඩී. අමරදේව	නාරද දිසාසේකර
සත්සමුදුර	සෝමදාස ඇල්විටිගල	සෝමදාස ඇල්විටිගල	ඩබ්. ඩී. අමරදේව
රේඛාව	බී.එස්. පෙරේරා	සුනිල් සාන්ත	ඉන්ද්‍රාණි විජේබණ්ඩාර සිසිර සේනාරත්න
ගැටවරයෝ	ඩබ්. ඩී. අමරදේව	ඩබ්. ඩී. අමරදේව	නාරද දිසාසේකර

(ලකුණු 03)

iii.

සුනිල් සාන්ත මහතා	ආනන්ද සමරකෝන් මහතා
ඕළු පිපීලා විල ලෙළ දෙනවා	ඇසේ මදුර ජීවනයේ ගීතා
මිහිකත නලවාලා	විලේ මලක් පිපිලා
වරෙන් හීන් සැරේ	අක්කෙ අක්කෙ අර බලන්නකෝ
එම්බා ගංගා	බැස සීගල ගගුලේ
දකුණ නැගෙනහිර	එන්නද මැනිකේ මමත් දියඹටා

(ලකුණු 04)

iv. මවි ගුණ ගීත 2ක් නම් කිරීම (ලකුණු 01)

6.

A. කර්ණාටක (දකුණු ඉන්දියානු) සංගීතය
B. අලගනායිදු
C. හින්දුස්තානි (උතුරු ඉන්දියානු) සංගීතය
D. විශ්වනාත් ලෞජී. ජයා ශංකර් (ලකුණු 04)

ii. සොකරි / කෝලම් (ලකුණු 02)

iii.

සොකරි	කෝලම්
කමත රංග භූමිය ලෙස යොදා ගනී	වෙස් මුහුණු පලදී
ගැට බෙරය, හොරණෑව,තාලම්පට යොදා ගනී	හෙංචප්පු,නොංචි.ආරච්චිල ආදි චරිත ඇතුළත් වේ
සශ්‍රීකත්වයේ සංඛේතයකි	සඹේ විදානේ චරිතය ඇතුලත් වේ.

(ලකුණු 03)

iv. කොටස් 4ක් සහිතයි

- බෙර පදය
- තානම
- කවිය
- ඉරට්ටිය

සිංදු වන්නම් නම්න්ද හදුන්වයි.
ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය පහතරට බෙරයයි.
තාලයක් සහ වෘත්තයක් මුල් වී ඇත.
ස්වර ක්ෂේත්‍රය පටුයි. (ලකුණු 03)

7. B b Major Scale (ලකුණු 01)

ii. 4 /4 (ලකුණු 01)

iii. ස නි ධ - / ම - ධ - / නිධ නිනි ධ - / ප ම ග ම / ස - - - /ස - - - / (ලකුණු 04)

iv. කොමළ නි , කෝමළ ග (ලකුණු 02)

v. මෝසාර්ට් - ප්‍රාග් , ජුපිටර්, no36 c major" no 39 Eb major
බිතෝවන් - eroica , choral , pastoral (ලකුණු 04)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library